රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி:(94) 011- 2694560 / Telephone
ෆැක්ස් / தொலைநகல்:(94) 011- 2692254 / Fax
ඊ-මේල් / மின்னஞ்சல்:dgcs@pubad.gov.lk / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk / Web Site

මගේ අංකය / எனது இல / My No: COM/TRANS/VI-25
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி: / Date: 2022.07.06

සියළුම ආයතන ප්‍රධානීන්ගේ දැනගැනීම සඳහා

**<u>කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධරයන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත තවකාලිකව අනුයුක්ත කිරීම</u>**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ කොළඹ කාර්යාලය වෙත පැමිණෙන දෛනික සේවාලාභීන්ගේ ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් පවතින තත්වයට සාර්ථකව මුහුණ දීමට එම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට අමතරව කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධරයන් තාවකාලික පදනම මත මාස තුනක කාලයක් සඳහා අනුයුක්ත කර දෙන ලෙස ආගමන හා විගමන පාලක ජනරාල් විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

02. ඒ අනුව ඔබ කාර්යාලයේ සේවයේ නියුතු, බත්තරමුල්ල ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට කිලෝමීටර් 10 පමණ දුරින් පදිංචි, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට මාස 03 කාලයක් සඳහා තාවකාලිකව අනුයුක්තව දිවා හා රාත්‍රී සේවා මුර ක්‍රමයට සේවය කිරීමට කැමැත්ත පළ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධරයන්ගේ ඉල්ලීම් හා ඒ පිළිබඳ ඔබගේ නිර්දේශ පහත සඳහන් ඊ තැපැල් ලිපිනයන් වෙත **2022.07.11 දිනට පෙර** යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටින අතර ඉල්ලීම් ලැබීමේ අනුපිළිවෙල අනුව අනුයුක්ත කිරීම් සිදුකරන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

dgcs.pubad@gmail.com
dcs1.pubad@gmail.com
ddcs4.pubad@gmail.com

03. කඩිනම් අවශ්‍යතාවයක් සේ සලකා මේ සම්බන්ධයෙන් ප්‍රමුඛතාව ලබාදී කටයුතු කරන්නේ නම් මැනවි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්